23
පාඩම

# බුදු දහමේ හේතුඵලවාදය

පටිච්ච සමුප්පාදය යනු බුදුදහමේ ඉගැන්වෙන මූලික ඉගැන්වීමකි. බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයෙන් පසු පළමු සතියේ බෝ මැඩ වැඩ සිටිමින් පටිච්ච සමුප්පාද ධර්මය මුල සිට අගටත් (අනුලෝම වශයෙන්) අග සිට මුලටත් (පටිලෝම වශයෙන්) මෙනෙහි කළහ. මෙම පටිච්ච සමුප්පාද හෙවත් හේතුඵල දහම බුදුරදුන්ගේ නව සොයා ගැනීමක් නොව ලොව සැමදා පවතින ධර්මතාවකි. එම ධර්මතාව බුදුන් වහන්සේ ලොවට පැහැදිලි කළහ.

ලෝකයේ ප්‍රධාන ආගම් (ලෝක ආගම්) ලෙස සලකනු ලබන යුදෙව් ආගම, ක්‍රිස්තියානි ආගම, ඉස්ලාම් ආගම, හින්දු ආගම සහ බුද්ධාගම යන ආගම් මූලික වශයෙන් දේවවාදී ආගම් සහ අදේවවාදී ආගම් වශයෙන් කොටස් දෙකකට බෙදා වෙන් කළ හැකි ය. ඒ අනුව බුදුදහම හැර අනෙකුත් ආගම් දේවවාදී ආගම් ලෙස සැලකේ. දේවවාදී ඉගැන්වීම් මගින් සත්ත්වයා හා ලෝක නිර්මාණය සර්වඥ (සියල්ල දන්නාවූ) සර්ව බලධාරී (ඕනෑම දෙයක් කිරීමේ ශක්තිය ඇති) සර්වතෝ භද්‍ර (හැම අතින් ම යහපත්) දෙවියෙකුට භාර කළහ. ආදි ඉන්දීයයන් මෙම දෙවියා "බ්‍රහ්ම" හෝ "ඊශ්වර" නමින් ද යුදෙව් හා ක්‍රිස්තියානි ආගමිකයන් "යොහොවා" නමින් ද ඉස්ලාම් ආගමිකයින් "අල්ලා" නමින් ද හඳුන්වනු ලැබී ය. මෙමගින් උත්සාහගෙන ඇත්තේ සත්ත්වයා හා ලෝකයේ නිර්මාණය මැවුම්කාර, සර්ව බලධාරී දෙවියෙකු සතු වූවක් බව පෙන්වීමට ය. පටිච්ච සමුප්පාදය මගින් මෙම දේවවාදී ආගම්හි ඉගැන්වීම් සපුරා බැහැර කළහ. මෙසේ බෞද්ධ නොවන සිද්ධාන්ත පසකින් තබා බෞද්ධ සිද්ධාන්ත විවරණය කර තහවුරු කිරීම පටිච්ච සමුප්පාදය මගින් සිදුව ඇත. කර්මය, විපාකය, සංසාරය, පුනර්භවය ආදිය නිදසුන් ලෙස දැක්විය හැකි ය. බුදුදහමේ මූලික ඉගැන්වීම් සියල්ල ගොඩනගා ඇත්තේ පටිච්ච සමුප්පාද පදනම මත ය.

**යමෙක් පටිච්ච සමුප්පාදය දකි ද**
**හේ ධර්මය දකී**
**යමෙක් ධර්මය දකි ද**
**හේ පටිච්ච සමුප්පාදය දකී**

මෙමගින් පැහැදිලි වන්නේ ධර්මාවබෝධය හා පටිච්ච සමුප්පාද අවබෝධය දෙකක් නොව එකක් ම බව යි.

උපතිස්ස, කෝලිත පිරිවැජියන් සත්‍යය සොයා යන ගමනේ දී සංජය පිරිවැජියා ගුරු කොට සත්‍යය සෙවූමුත් ඔහුගෙන් එය ලබා ගැනීමට නොහැකි වූ විට ඔහු අතහැර දෙමගක ගියහ. උපතිස්ස පිරිවැජියාට අස්සජි මහරහතන් වහන්සේ හමු වූ විට ඔබ වහන්සේගේ ශාස්තෘවරයා දෙසූ දහම කුමක්දැයි විමසී ය. අස්සජි මහ රහතන් වහන්සේගේ පිළිතුර වූයේ පටිච්චසමුප්පාදය බවයි. එය මෙසේ ය.

යෙ ධම්මා හෙතුප්පභවා තෙසං හෙතුං තථාගතො ආහ
තෙසං ච යො නිරොධො එවං වාදී මහා සමණො.

**යම් හේතුවකින් උපදින යම් ධර්මයක් වෙත් ද**
**ඒ හේතුව තථාගතයන් වහන්සේ දේශනා කළහ.**
**ඒවායේ යම් නිරෝධයක් වේ ද එය ද වදාළහ.**
**මහා ශ්‍රමණ තෙමේ මෙබඳු වාද ඇත්තේ ය.**

සත්ත්වයා සසර සැරීමට හේතුව මේ හේතුඵල දහම නොදැනීමෙන් අවුලෙන් අවුලට පත්වන බැවින් බව බුදුරජාණන් වහන්සේ දේශනා කළහ. (දී.නි. මහා නිදාන සූත්‍රය)

පටිච්ච සමුප්පාද යන්න තේරුම් ගැනීමේ දී එහි වචනාර්ථය තේරුම් ගැනීම වටී. ''පටිච්ච '' යනු ප්‍රත්‍ය කොට ගෙන, හේතුකොට ගෙන යනු යි. සමුප්පාද (සං+උප්පාද) යනු හට ගැනීම යි. විශ්වයේ ස්වභාවය පිළිබඳ බෞද්ධ අවබෝධය වන්නේ අදාළ හේතුන්ගේ හා ප්‍රත්‍යයන්ගේ සමවායෙන් ඊට උචිත වූ ඵලයන් හටගන්නා බව යි. ලෝකයේ ක්‍රියාකාරීත්වය හා පැවැත්ම සිදුවන්නේ මෙම ක්‍රියාදාමය තුළින් බව ඒ අනුව ප්‍රකාශ වේ.

පටිච්ච සමුප්පාද දේශනාවෙන් ප්‍රතික්ෂේප වන කරුණු හතරක් සංයුත්ත නිකායේ අචේල කස්සප සූත්‍රයෙහි දැක්වේ. අචේල කස්සප බුදුරදුන්ගෙන් පහත සඳහන් ප්‍රශ්න අසයි.

1. **දුක තමා විසින් කරන ලද ද? (සයංකතං දුක්ඛං)**
2. **දුක අනුන් විසින් කරන ලද ද? (පරකතං දුක්ඛං)**
3. **දුක තමා සහ අනුන් යන ආයතන දෙක ම විසින් කරන ලද ද? (සයංකතං ච පරකතං ච දුක්ඛං)**
4. **දුක තමා සහ අනුන් යන ආයතන දෙක විසින් නොකරන ලද ද? (අසයංකාරං අපරංකාරං අධිච්චසමුප්පන්නං දුක්ඛං)**

මෙම ප්‍රශ්න හතරට ම එසේ නොවේ යන්න බුදුරදුන්ගේ පිළිතුර විය. එයින් කණස්සල්ලට පත් අචේල කස්සප දුක නොපවත්නේ ද (නත්ථි දුක්ඛං) යනුවෙන් අසයි. මෙය ද ප්‍රතික්ෂේප කරන බුදුහු දුක සත්‍යය වශයෙන් පවත්නා බව ප්‍රකාශ කරති. අවසන් ප්‍රශ්නයට ලැබෙන ඇත යන අර්ථයෙන් අචේල කස්සප වඩාත් වික්ෂිප්ත වන්නේ ඔහුගේ මූලික ප්‍රශ්න පිටුපස පවත්නා මානසිකත්වයට අනුව එක්කෝ යමක් තමා විසින් කළ යුතු ය. නැත්නම් තමාගෙන් පරිබාහිර ආයතනයක් මගින් කළ යුතු ය. ඒ දෙක ම නොවන්නේ නම් විය යුත්තේ අහේතුකව යමක් සිදුවීම යි. අහේතුකව යමක් සිදු නොවේනම් තත්ත්වය විය යුත්තේ එම වස්තුවේ අභාවය යි. ඉහත සඳහන් කරුණු හතරට ඇතුළත් නො වී පවත්නා ධර්මතාවක් ගැන කෙසේ කතා කළ හැකි ද? අචේල කස්සපගේ මෙම ගැටලුවට බුදුරදුන් දෙන පිළිතුරු නම් දුක පටිච්ච සමුප්පන්නව සිදුවන බවයි.

මෙම පිළිතුරෙහි දාර්ශනික අර්ථය නම් අන්තවලට නොවැටීම යි. එනම් මධ්‍යයෙන් සත්ත්වයාගේ දුක පිළිබඳ පැහැදිලි කිරීම යි. දුකෙහි කර්තෘ හෙවත් කරන්නා ලෙස තමා හෝ අනුන් හෝ හඳුනා ගැනීමෙහි පිටුපස ඇත්තේ ශාස්වතවාදය හා උච්ඡේදවාදය යන අන්ත දෙකයි. මෙහි පළමු වැන්නෙන් සදාකාලික ආත්මයක් හෙවත් ක්‍රියාකාරිකයෙක් පිළිගනු ලබන අතර, දෙවැන්නෙන් එබඳු ආත්මයක් හෙවත් ක්‍රියාකාරිකයෙකුගේ පැවැත්ම නිෂේධනය කරනු ලැබී ය. මෙම ශාස්වතවාදය හා උච්ඡේදවාදය යන අන්ත දෙක ම ප්‍රතික්ෂේප කළ බුදුරජාණන් වහන්සේ මධ්‍යයෙන් ධර්මය දේශනා කළේ පටිච්ච සමුප්පාදය පිළිබඳ ඉගැන්වීම පදනම් කොටගෙන ය.

**(එතෙ තෙ උභො අනෙත අනුපගම්ම මජ්ඣෙන තථාගතො ධම්මං දෙසෙති යදිදං අවිජ්ජා පච්චයා සංඛාරා)**

පටිච්ච සමුප්පාද ක්‍රියාකාරීත්වය ලොව සැමදා පවතී. බුදුවරුන් ලොව පහළ වුව ද නැත ද ලොව පවතී. එහෙත් බුදුරජාණන් වහන්සේ මැනවින් එම ධර්මතාව අවබෝධ කොට සත්ත්වයාට දේශනා කළහ. එම පටිච්ච සමුප්පාද න්‍යාය සරල සූත්‍රයක් මගින් මෙසේ පෙන්වා දී ඇත.

| | |
|---|---|
| **අසම්ං සති ඉදං හොති** | **- මෙය ඇති කල්හි මෙය වේ.** |
| **ඉමසස උපපාදා ඉදං උපපජ්ජති** | **- මෙය හට ගැනීමෙන් මෙය හට ගනී** |
| **අසම්ං අසති ඉදං න හොති** | **- මෙය නැති කල්හි මෙය ඇති නොවේ.** |
| **ඉමසස නිරොධා ඉදං නිරුජ්ඣති** | **- මෙය නැති වීමෙන් මෙය නැති වේ.** |

එසේ ම පහත සඳහන් ප්‍රකාශය සැලකිල්ලෙන් විමසා බලන කල පටිච්චසමුප්පාදයේ ස්වභාවය තවදුරටත් මැනවින් අවබෝධ කරගත හැකි ය.

| | |
|---|---|
| A ඇති විට | B වෙයි. |
| A ඉපදීමෙන් | B උපදියි. |
| A නැති විට | B නොවේ. |
| A නැතිවීමෙන් | B නැතිවෙයි. |

මෙය තවදුරටත් පහසුවෙන් තේරුම් ගැනීම සඳහා මෙසේ දැක්විය හැකි ය.

**බීජය ඇති කල්හි පැලය ඇති වේ.**
**බීජය නැතිනම් පැලයක් ඇති නොවේ.**

පටිච්ච සමුප්පාදය ගස්වැල් සහිත සත්ත්ව ලෝකයෙහි ද මිනිස් මනසෙහි ද එකසේ ක්‍රියාත්මක වේ. නියාම ධර්ම පහක් වශයෙන් බුදුදහමේ සඳහන් වනුයේ සමස්ත ලෝකයෙහි ක්‍රියාත්මක වන මෙම ස්වභාවය යි. බුදුදහමේ දැක්වෙන නියාම ධර්ම මෙසේ ය.



1. **උතු නියාමය** - ලෝකයෙහි කාලගුණික වෙනස්කම් හේතු-ඵල අනුරූපව සිදුවීම.
2. **බීජ නියාම** - බීජයට අනුව පැලය හට ගැනීම හේතු-ඵල අනුරූපව සිදුවීම.
3. **කම්ම නියාම** - හොඳ නරක කර්මවලට හොඳ නරක විපාක ලැබීම හේතු-ඵල අනුරූපව සිදුවීම.
4. **ධම්ම නියාම** - ලෝක ධර්මතා නමින් සැලකෙන ස්වභාව ධර්මයේ සිදුවීම. හේතු-ඵල අනුරූපව සිදුවීම.
5. **චිත්ත නියාම** - සිතෙහි ක්‍රියාකාරිත්වය හේතු-ඵල අනුරූපව සිදුවීම.

මෙම නියාම ධර්ම සියල්ල සමස්ත ලෝකයෙහි කායික හා මානසික ක්‍රියා විවරණය කිරීමට පොදු වූ ධර්මතාවන් ය. හේතුඵල දහමට අනුරූප නොවන කිසිවක් සමස්ත ලෝකයෙහි දක්නට නොලැබේ.

පටිච්ච සමුප්පාද සිද්ධාන්තය මගින් බුදුදහම අපහට දුක ඇතිවන්නේ කෙසේ ද යන්න හා එම දුක නැතිවන්නේ කෙසේ ද යන්න විග්‍රහ කරයි. සත්ත්වයාගේ දුක ඇතිවීම පටිච්ච සමුප්පාද ඉගැන්වීමෙන් පැහැදිලි කෙරෙනුයේ එකිනෙක හා බැඳුණු අංග දොළහකින් (12) සිදුවන්නක් ලෙස ය. එම අංග දොළහ නම් අවිජ්ජා, සංඛාර, විඤ්ඤාණ, නාමරූප, සළායතන, ඵස්ස, වේදනා, තණ්හා, උපාදාන, භව, ජාති, ජරා, මරණ, යන මේවා ය.

මෙම අංග දොළොසින් අනුලෝම වශයෙන් සසර දුක් ඇතිවන ආකාරය පෙන්වා දී ඇත. එම හේතු ප්‍රත්‍ය ධර්මයන් නැති කිරීමෙන් සසර දුක් නැතිවන ආකාරය පටිලෝම පටිච්ච සමුප්පාදයෙන් පැහැදිලි කෙරේ. මෙසේ හේතු ප්‍රත්‍ය ධර්මතා ඇති කළ සසර දුක් ඇතිවන සැටිත් හේතු ප්‍රත්‍ය ධර්ම නැති කළ සසර දුක් නැතිවන සැටිත් පටිච්ච සමුප්පාදයෙන් පැහැදිලි කෙරේ.

දුක පිළිබඳ පටිච්ච සමුප්පාද සිද්ධාන්තයට අයත් අංග දොළොස කෙටියෙන් මෙසේ ය.

**අවිජ්ජා** - අවිද්‍යාව (නොදැනීම, අනවබෝධය) චතුරාර්ය සත්‍යය පිළිබඳ නොදැනීම.
**සංඛාර** - සංස්කාර හෙවත් තිදොරින් රැස් කරන කුසල් හා අකුසල්.
**විඤ්ඤාණ** - ඉන්ද්‍රිය හා අරමුණු හේතු කොට ගෙන ඇතිවන සිත.
**නාම රූප** - ශරීරය හා මනස යන අංග දෙකේ එකතුව (රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ).
**සළායතන** - ෂඩායතන (ඇස, කන, නාසය, දිව, ශරීරය, මනස).
**ඵස්ස** - ස්පර්ශය (ඉන්ද්‍රිය, අරමුණු, විඤ්ඤාණය යන තුන එකට එක් වීම).
**වේදනා** - විඳීම ( ස්පර්ශය හේතුවෙන් ඇතිවන සැප, දුක්, උපේක්ඛා, වේදනා).
**තණ්හා** - තෘෂ්ණාව (වේදනාව හේතුවෙන් ඇතිවන ඇලීම).
**උපාදාන** - අල්ලා ගැනීම (උපාදාන හේතුවෙන් දැඩිව අල්ලා ගැනීම).
**භව** - භවය (උපාදාන හේතුවෙන් උපත ලැබීමට කිසියම් භවයක් ඇතිවීම).

**ජාති** - උපත (භවය ඇතිවීම හේතුවෙන් එම භවයේ උපත ලැබීම).
**ජරා-මරණ** - මහලුවීම, මරණය (උපත ලැබීම හේතුවෙන් මහලුවීම හා ලෙඩවීම, මරණය ආදී දුක් ඇතිවීම).

හේතුඵල සිද්ධාන්තයට අනුව සත්ත්වයාගේ අභ්‍යන්තරයෙහි දුක් ඇතිවන හා නැතිවන ආකාරය මෙම අංග දොළොසින් දැක්වේ. මෙම පුද්ගල දුකට අමතරව සමාජගත දුක යයි හැඳින්විය හැකි අංගයක් ද පවතී. බුදුරජාණන් වහන්සේ සමාජ ගත දුක ඇතිවන හා නැතිවන ආකාරය බොහෝ සූත්‍ර මගින් පෙන්වා වදාළහ. මජ්ඣිම නිකායේ සල්ලේඛ සූත්‍රයේ සමාජ දුක් ඇතිවන ආකාරය පෙන්වන්නේ මෙසේ ය.

තණ්හාව හේතුවෙන් සෙවීම වේ. සෙවීම හේතුවෙන් ලැබීම වේ. ලැබීම හේතුවෙන් හොඳ නරක තීරණය කිරීම වේ. එසේ තීරණය කිරීම හේතුවෙන් ඇලීම වේ. ඇලීම හේතුවෙන් අයිතිය පිළිබඳ හැඟීම වේ. අයිතිය පිළිබඳ හැඟීමෙන් අයිති කර ගැනීම වේ. අයිති කර ගැනීමෙන් මසුරුබව (අන් අයට හිමිකර නොදීමේ ස්වභාවය) වේ. මසුරු බව හේතුවෙන් ආයුධ ගැනීම්, කළහ, ගැටුම්, අපහාස, කේලාම් කීම, බොරුකීම, වැනි අකුසල ක්‍රියා රාශියක් ඇති වේ.

මෙහි දැක්වෙන දුක වූ කලී ඉපදීම, වයසට යෑම, ලෙඩවීම, මරණය ආදී දුක නොව තෘෂ්ණාව හේතුවෙන් මිනිසුන් එකිනෙකා හා සටන් කිරීමට පෙළඹීමෙන් ඇතිවන දුක ය.

පටිච්ච සමුප්පාද සිද්ධාන්තය අපට වැදගත් වන්නේ දුක ඇති කරවන ආකාරය හා දුක නැතිවන ආකාරය තේරුම් ගැනීමට ය. දුක ඇතිවන ආකාරය තේරුම් ගත් විට එය ඇතිවීමට හේතු වූ සාධක නැති කිරීමෙන් දුක නැති කළ හැකි ය. පටිච්ච සමුප්පාද සිද්ධාන්තයේ මූලික පරමාර්ථය වනුයේ පුද්ගල හා සමාජ දුක නැති කිරීම ය. ඒ බව පහත ධර්ම පාඨයෙන් පැහැදිලි වේ.

**හෙතුං පටිච්ච සම්භූතං - හෙතු භංගා නිරුජ්ඣති.**

**හේතුවකින් හටගත් යමක් වේ නම් එම හේතුව නැතිවීමෙන් අවසන් වේ.**

**අභ්‍යාස**

01. පටිච්ච සමුප්පාද යන්නෙහි අර්ථය පැහැදිලි කරන්න.
02. පටිච්ච සමුප්පාදයේ අංග දොළොස පිළිවෙළින් ලියන්න.
03. යේ ධම්මා හේතුප්පභවා යන ගාථාව සම්පූර්ණ කර අර්ථය ලියන්න.
04. සමාජගත දුක කෙටියෙන් පැහැදිලි කරන්න.